සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

80 | S | I

# පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020
# First Term Test - Grade 10 - 2020

නම/විභාග අංකය :..........................

## තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය - I

කාලය: පැය 01යි.

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට, දී ඇති 1, 2, 3, 4 උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුරට අදාළ වරණය තෝරා ගන්න.
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා ඔබ තෝරාගත් වරණයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(1) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය වඩාත් හොඳින් විස්තර කෙරෙන ප්‍රකාශය තෝරන්න.
1. සකස් කළ තොරතුරු සන්නිවේදන කිරීම සඳහා භාවිතා කරන තාක්ෂණයකි.
2. දත්ත සකස් කර තොරතුරු බවට පත් කිරීම සඳහා යොදාගැනෙන තාක්ෂණයකි
3. තොරතුරු සකස් කරගැනීම හා හුවමාරු කර ගැනීමකි.
4. දත්ත සකස් කර තොරතුරු බවට පත් කිරීමටත්, ඒවා ගබඩා කර ගැනීමටත්, හුවමාරු කර ගැනීමටත් භාවිතා කරන තාක්ෂණයයි.

(2) කෘෂි කර්මාන්තයේ දී තොරතුරු තාක්ෂණය යොදා ගන්නා අවස්ථා ලෙස බෝග වගාව, සත්ත්ව පාලනය සහ ධීවර කර්මාන්තය හඳුන්වා දිය හැක. බෝග වගාව සඳහා **පමණක්** යොදා ගනු ලබන යන්ත්‍ර නිවැරදිව සඳහන් කර ඇති පිළිතුර වනුයේ,

A. කාලගුණ මිණුම් යන්ත්‍රය
B. ගුවන් විදුලි සංඥා හැඳුනුම් උපකරණය (RFID)
C. ස්වයංක්‍රීය වල් පැළ ඉවත්කරණය

1. A හා B  2. C පමණි  3. B හා C  4. A හා C

(3) ඉගෙනුම් කළමණාකරණ පද්ධතියක් මගින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ පාර්ශවයන් වෙත ලබාදෙන පහසුකම් කීපයක් පහත දැක්වේ.

A. පැවරුම් ආදිය නිවසේදීම සිදුකර උඩුගත කළ හැකිවීම
B. පාසල් තොරතුරු යාවත්කාලීන කිරීමේ හැකියාව
C. සංවාද මණ්ඩප හා සම්බන්ධ වී ගැටලු සඳහා ප්‍රතිචාර දැක්වීමට හැකිවීම

ඉහත පහසුකම් සිසුන්ට, ගුරුවරුන්ට හා පරිපාලකයින්ට පිළිවෙලින් දැක්වෙන පිළිතුර වනුයේ,

1. A C B  2. B A C  3. B C A  4. C B A

(4) අධ්‍යාපන ක්ෂේත්‍රයේදී ශිෂ්‍යයෙකුට අන්තර්ජාලය හා සම්බන්ධ වෙමින් අධ්‍යාපනය ලැබිය හැකි වෙබ් අඩවි පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.
1. www.schoolnet.lk, www.facebook.com, www.bbc.com
2. www.e-thaksalawa.moe.gov.lk, www.vidumanpetha.lk, www.schoolnet.lk
3. www.ebay.com www.schoolnet.lk, www.amazon.com,
4. www.schoolnet.lk, www.webpatashala.com, www.cnn.com

(5) නැවක ගමන්ගත් මගීන් පිරිසකට කොරෝනා වෛරසයේ රෝග ලක්ෂණ ඇතිබවට නාවිකයින් විසින් රෝහලට දැනුම්දෙන ලදි. රෝහලේ කාර්ය මණ්ඩලය විසින් නැවේ සිටි මගීන්ට ප්‍රතිකාර ලබා දුන් දුරස්ථ සෞඛ්‍ය රැකවරණයේ **වඩාත්** ගැළපෙන ලක්ෂණයක් වන්නේ,

1. නිවසේ සිට අධීක්ෂණය  2. දුරස්ථ ශල්‍යකර්ම
3. දුරස්ථ සෞඛ්‍ය උවටැන්  4. දුරස්ථ පුහුණුව

(6) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ යෙදවුම් මගින් මිනිසාගේ කාර්යයන් ඉතා පහසු වී ඇත. එමෙන්ම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය අනිසි ලෙස භාවිතයෙන් ඔබට පමණක් නොව මුළු මහත් සමාජයටම අවැඩක් සිදු විය හැක. ඉන් එක් අනිසි ප්‍රතිඵලයක් ලෙස ඇබ්බැහිවීම සඳහන් කළ හැක. මේ නිසා සිදුවන ශාරීරික අපහසුතාවයක් වනුයේ,

A. අක්ෂි ආබාධ

B. කොන්දෙ අමාරුව

C. හිසේ කැක්කුම

1. B හා C  2. A පමණි  3. A හා B  4. A, B හා C

(7) දත්ත ආදානය කිරීම සඳහා යතුරු පුවරුව සහ මූසිකය භාවිත කරන ලද්දේ කුමන පරම්පරාවේ පරිගණකවලද?

1. පළමු පරම්පරාවේ පරිගණක  2. දෙවන පරම්පරාවේ පරිගණක
3. තුන්වන පරම්පරාවේ පරිගණක  4. හතරවන පරම්පරාවේ පරිගණක

(8) පරිගණකය පළමු පරම්පරවේ සිට පස්වෙනි පරම්පරාව දක්වා පරිණාමයේදී සිදුවූ වෙනස්කම් සම්බන්ධ ප්‍රකාශ කීපයක් පහත දැක්වේ.

A. පරිගණකයේ ප්‍රමාණය සහ විදුලිය වැයවීම අඩුවිය.

B. වේගය සහ ගබඩාකළ හැකි ධාරිතාව අඩු විය.

C. බහුකාර්ය උපකරණයක් වීම සහ භාවිතය වැඩිවීම.

මෙම ප්‍රකාශ අතුරින් සත්‍ය වන්නේ


1. A පමණි  2. A හා B පමණි  3. A හා C පමණි  4. A B හා C සියල්ල

(9) ආදාන, ප්‍රතිදාන, ආචායන උපක්‍රමයක් ලෙස ජෝසෆ් ජැකුවාර්ඩ් විසින් ලොවට හඳුන්වා දුන් සිදුරු පත්‍රිකා ක්‍රමය භාවිතා කර සකස් කරන ලද ප්‍රථම පරිගණකය වන්නේ,

1. Pascaline  2. Analytical Engine  3. Difference Engine  4. ENIAC

(10) පරිගණකයේ භාවිතා කරන පහත දැක්වෙන උපාංග වලට අදාළ අක්ෂර හා දී ඇති කොටුව තුළ දැක්වෙන ධාරිතාවන් වලට අදාළ අංක හා සැසඳු විට පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

**A.** නම්‍ය තැටි  **B.** සංයුක්ත තැටි  **C.** දෘඪ තැටිය  **D.** සංඛ්‍යාංක බහුවිධ තැටි




1. A → II, B → IV C → III, D → I
2. A → II, B → III, C → I, D → IV
3. A → I, B → IV C → III, D → II
4. A → IV B → III, C → II, D → I

(11) ආදාන හා ප්‍රතිදාන යන දෙකම සිදුකල හැකි උපාංග කිහිපයක නම් පවසන මෙන් ගුරුතුමා විසින් ඉදිරිපත් කළ ප්‍රශ්නයට ප්‍රදීප් විසින් ලබාදුන් පිළිතුරු පහත දැක්වේ.

A. ස්පර්ශ පෑඩය  B. ස්පර්ශ සංවේදී තිරය
C. ඩිජිටල් කැමරාව  D. වෙබ් කැමරාව

මෙම පිළිතුරු අතරින් නිවැරදි උපාංග පමණක් ඇතුලත් ප්‍රකාශය කුමක්ද

1. A හා B  2. A හා B  3. B හා C  4. B ,C හා D

(12) පාසල් කාර්යාලය තුල ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රණය කර ඇති ලේඛන රාශියක් ඉතා කෙටි කාලයක් තුල සුපරික්ෂණය කර (ස්කෑන් ) පරිගණක ගත කිරීමට අවශ්‍ය නම් යොදා ගත යුතු ආදාන උපක්‍රමය වන්නේ,

1. OCR (ප්‍රකාශ අක්ෂර සංජානනය)
2. OMR (ප්‍රකාශ සලකුණු සංජානනය)
3. MICR (චුම්භක තීන්ත අනුලක්ෂණ කියවනය)
4. පැතලි තිර සුපරීක්ෂකය

(13) පහත දී ඇති වගුවේ A තීරුවේ සදහන් උපක්‍රම පරිගණකයට සම්බන්ධ කරන කෙවෙනි B තීරුවේ දක්වා ඇත ඒවා නිවැරදිව ගලපා ඇති පිළිතුර කුමක්ද ?

| A තීරුව | B තීරුව |
|---|---|
| P බහු මාධ්‍ය ප්‍රක්ෂේපකය | 1 USB කෙවෙනිය |
| Q මුද්‍රණ යන්ත්‍රය | 2 ශ්‍රේණිගත කෙවෙනිය |
| R මොඩමය | 3 HDMI කෙවෙනිය |
| S මූසිකය | 4 සමාන්තර කෙවෙනිය |

1. P-3, Q-4, R-1, S-2
2. P-3, Q-1, R-2, S-4
3. P-3, Q-4, R-2, S-1
4. P-3, Q-1, R-4, S-2

(14) සංඝට්ටන නොවන මුද්‍රණ යන්ත්‍ර ඇතුලත් පිළිතුර වන්නේ

A. තිත් න්‍යාස මුද්‍රකය B. තාප මුද්‍රකය C. ලේසර් මුද්‍රකය D. ජෙට් මුද්‍රකය

1 A හා B 2 B හා C 3 C පමණ 4 C හා D

(15) සංජීව තම පරිගණකයේ පැවැති කැතෝඩ කිරණ නල දර්ශකය (CRT monitor) ඉවත් කර ද්‍රව ස්පටික ප්‍රදර්ශක (LCD monitor) සම්බන්ධ කරන ලදි. මෙයට හේතු වූ කරණු කිපයක් පහත දැක්වේ.

A. අඩු ඉඩක් ප්‍රමාණවත් වීම
B. කල් පැවැත්ම වැඩිවීම
C. විදුලිය වැයවීම අඩුවීම.

මින් සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ,

1. A පමණි 2. A හා B පමණි 3. A හා C පමණි 4. A, B හා C සියල්ල

(16) දත්ත සැකසීම සඳහා ට්‍රාන්සිස්ටරය යොදාගැනීම හා මෙහෙයුම් පද්ධතිය බිහිවීම පරිගණක පරිණාමයේ වැදගත් සන්ධිස්ථාන දෙකකි. එම පරිණාමයන් සිදු වූ පරම්පරා දෙක පිළිවෙලින් දක්වා ඇත්තේ කුමන පිළිතුරේ ද ?

1. දෙවන පරම්පරාව සහ තෙවන පරම්පරාව
2. පළමු පරම්පරාව සහ තෙවන පරම්පරාව
3. පළමු පරම්පරාව සහ සිව්වන පරම්පරාව
4. දෙවන පරම්පරාව සහ සිව්වන පරම්පරාව

(17) අත්යුරු ලෙස කාර්යාලයේ කටයුතු සිදු කරන එක්තරා ආයතනයක් පරිගණක ගත කිරීම සඳහා තීරණය කිරීමට හේතු වූ පරිගණකයේ සුවිශේෂී ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

ඒවා අතරින් නිවැරදි ප්‍රකාශය විය යුත්තේ කුමක්ද?

1 වේගය, නිරවද්‍යතාවය, කාර්යක්ෂමතාවය, බුද්ධිමත් භාවය
2 සුරැකීමේ හැකියාව, බුද්ධිමත් භාවය, බහුකාර්ය බව, කාර්යක්ෂමතාවය
3 වේගය, සුරැකීමේ හැකියාව, බුද්ධිමත් භාවය, නිරවද්‍යතාවය
4 වේගය, නිරවද්‍යතාවය, සුරැකීමේ හැකියාව, බහුකාර්ය බව

(18) පරිගණකයේ දත්ත සකස් කිරීමේ දී ..........A.......... මගින් ලබා දෙන දත්ත..........B........... තුල තාවකාලිකව රඳවා තබාගනිමින් මධ්‍ය සැකසුම් ඒකකයේ .............C............ මගින් ගණනය කර රෙජිස්තර මතකය හරහා ප්‍රධාන මතකයට නැවත ලබාගෙන ප්‍රතිදානය කරනු ලබයි. මෙහි A, B, C යන ස්ථාන වලට අදාල ලේබල පිළිවෙලින් දක්වෙන පිළිතුර වන්නේ,

1. පාලන ඒකකය, ප්‍රධාන මතකය, ආදාන උපාංග
2. ප්‍රධාන මතකය, ආදාන උපාංග, ගණිතමය හා තාර්කික ඒකකය
3. ආදාන උපාංග, ප්‍රධාන මතකය, ගණිතමය හා තාර්කික ඒකකය
4. ප්‍රතිදාන උපාංග, ප්‍රධාන මතකය, ගණිතමය හා තාර්කික ඒකකය

(19) පරිගණකයේ දත්ත ගබඩා කරන උපාංග පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න

A. දෘඩ තැටිය චුම්භක තාක්ෂණය භාවිතයෙන් නිර්මිත උපාංගයකි.

B. ඝණ තත්වයේ තාක්ෂණයෙන් භාවිතයෙන් සකස් කළ උපාංග වර්තමානයේ ඉතා ජනප්‍රිය වී ඇත.

C. සංයුක්ත තැටියක දෘඩ තැටියකට වඩා දත්ත ගබඩා කළ හැකි ය.

මෙම ප්‍රකාශ අතුරින් සත්‍ය වන්නේ

1. A පමණි  2. A හා B පමණි  3. A හා C පමණි  4. A B හා C සියල්ල

(20) පරිගණක උපාංග අලෙවි සැලකට ගිය ශාන්ත, මුද්‍රකයක්, සුපරික්ෂණයක්, යතුරු පුවරුවක් හා සංදර්ශකයක් මිලට ගත්තේය. ඉන් .........A.......... ප්‍රතිදාන උපාංගයක් වන අතර .............B............... ආදාන උපාංගයක් විය. මෙහි A සහ B සඳහා ගැළපෙන උපාංග වනුයේ,

1. සංදර්ශකය හා මුද්‍රකය  2. මුද්‍රකය හා යතුරුපුවරුව

3. සුපරික්ෂණය හා යතුරු පුවරුව  4. මුද්‍රකය හා සංදර්ශකය

(21) පන්තියේ කණ්ඩායම් ක්‍රියාකාරමක දී සහන් ඇතුළු කණ්ඩායමට පැවරුණේ දත්ත හා තොරතුරු ඇතුළත් ලැයිස්තුවකින් තොරතුරු වෙන්කර හඳුනා ගැනීමටයි ඔවුන් විසින් තොරතුරු යැයි හඳුනාගත් කිහිපයක් පහත දැක්වේ. ඒ අතරින් නිවැරදිව හඳුනාගෙන ඇති තොරතුරු මොනවාද?

A. මාසික විදුලි බිල්පත

B . 10 ශ්‍රේණියේ එක් එක් සිසුවාගේ ස්කන්ධය

C. 2019 අඩුම වාර්ෂික වර්ෂාපතනය පුත්තලමෙන් වාර්තා වී ඇත

1. A පමණි  2. A හා B පමණි  3. A හා C පමණි  4. A B හා C සියල්ල

(22)

**System**

| | | |
|---|---|---|
| Processor: | Intel(R) Core(TM) i7-4510U CPU @ 2.00GHz 2.60 GHz | lenovo |
| Installed memory (RAM): | 8.00 GB | Support Information |
| System type: | 64-bit Operating System, x64-based processor | |
| Pen and Touch: | Full Windows Touch Support with 10 Touch Points | |

ඉහත රූප සටහනෙන් දැක්වෙන්නේ එක්තරා පරිගණකයක පද්ධති තොරතුරු සමූහයකි. එම ඉහත තොරතුරු වලට අනුව පරිගණකයේ හෝරා වේගය (Clock Speed) හා සසම්භාවී ප්‍රවේශ මතකයෙහි පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක් ද?

1. 2.00 GHz - 2.6 GHz , 64bit  2. i7-4510U , 8GB

3. 2.00 GHz - 2.6 GHz , 8GB  4. 2.00 GHz , 2.6 GHz

(23) දත්ත සම්ප්‍රේෂණය සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.

A. පරිගණකයේ පද්ධති ඒකකය හා මුද්‍රකය අතර දත්ත සම්ප්‍රේෂණය ඒකපථ වේ.


B. පූර්ණ ද්වීපථ දත්ත සම්ප්‍රේෂණයට වඩා අර්ධ ද්වීපථ දත්ත සම්ප්‍රේෂණය වේගවත් ය.

C. එකවරකට එක් දිශාවකට පමණක් දත්ත සම්ප්‍රේශණය වීම අර්ධ ද්වීපථ සම්ප්‍රේෂණයයි.

මෙම ප්‍රකාශ අතුරින් සත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,

1. A පමණි  2. හා B පමණි  3. A හා C පමණි  4. A B හා C සියල්ල

(24) පහත රූප සටහනේ P, Q, R, S ලෙස දක්වා ඇති උපාංග පිළිවෙලින් නම් කළ විට පිළිතුර වන්නේ,




1. මුද්‍රකය, ස්විචය, සේවායෝජක පරිගණකය, සේවාලාභි පරිගණකය

2. මුද්‍රකය, මාර්ගකය, සේවාලාභි පරිගණකය, සේවායෝජක පරිගණකය

3. මාර්ගකය, ස්විචය, සේවාලාභි පරිගණකය, සේවායෝජක පරිගණකය

3. මාර්ගකය, ස්විචය, සේවාදායක පරිගණකය, සේවාලාභි පරිගණකය

(25) පරිගණක ජාලකරණය මගින් ලබා ගත හැකි වාසියක් නොවන්නේ,

1. සම්පත් පොදුවේ භාවිතා කළ හැකි වීම.
2. පරිගණක අතර සන්නිවේදනය කළ හැකි වීම.
3. අන්තර්ජාල පහසුකම් භාවිතයේදී පිරිවැය වැඩි වීම.
4. ගොනු හුවමාරු කිරීමට පහසු වීම.

(26) පරිගණක ජාලකරණයේ දී භවිතාකරන ස්ථලවිද්‍යා පිලිබඳව අධ්‍යයනයකින් අනතුරුව සමන් විසින් තම ව්‍යාපාර ස්ථානයේ පරිගණක ජාලගත කිරීම සඳහා තරු ආකාරයේ ජාල ස්ථල විද්‍යාව තෝරා ගැණුනි. මේ සඳහා හේතු වී ඇතැයි සිතන හේතු කීපයක් පහත දැක්වේ.

A. උපාංග මධ්‍යගතව පාලනය කළ හැකිවීම.

B. ජාලය තුල එක් පරිගණකයක් අකර්මණ්‍ය වුව ද ජාලය බිඳ නොවැටීම.

C. එක් පරිගණකයක සිට අනෙක් සෑම පරිගණකයක්ම රැහැන් මගින් එකිනෙක සම්බන්ධ වීම

මින් සත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ මොනවාද?

1. A පමණි  2. A හා B පමණි  3. A හා C පමණි  4. A , B හා C සියල්ල

(27) පරිගණක ජාලගත කිරීම සඳහා භාවිතා කරන ජ--ාලකරණ අතුරු මුහුණත් කාඩ් පතෙහි වෙනත් පරිගණකයක් හෝ ස්විචයක් සමග සම්බන්ධ කිරීමට යොදාගන්නා කෙවෙනිය වන්නේ,

1. PS/2 කෙවෙනිය  2. USB කෙවෙනිය  3. RJ/45 කෙවෙනිය  4. VGA කෙවෙනිය

(28) පරිගණක වර්ග සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශ හා ඉදිරියේ ඇති තීරුවේ පරිගණක වර්ග හා සැසඳුවිට ගැළපෙන පිළිතුර තෝරන්න.

| | |
|---|---|
| P | සුපිරි පරිගණක |
| Q | ක්ෂුද්‍ර පරිගණක |
| R | මධ්‍ය පරිමාණයේ පරිගණක |

A. බැංකු, රක්ෂණ සමාගම් වැනි ආයතන වල දත්ත සැකසීම සඳහා යොදාගනී.

B. අති ප්‍රබල දත්ත සැකසීමේ වේගයකින් යුතු වූ විශාල පරිගණකයකි.

C. එදිනෙදා කටයුතු සඳහා බහුලව භාවිතා කරයි.

1. A → R,  B → Q,  C → P
2. A → R,  B → P  C → Q
3. A → Q,  B → P  C → R
4. A → P,  B → R  C → Q

(29) පරිගණක ජාලකරණය සඳහා භාවිතා නොකරන උපාංගයක් වන්නේ,

1. ස්විචය (Switch)  2. සේවා දායක පරිගණක (server)
3. මුද්‍රණ යන්ත්‍රය (Printer)  4. නාභිය (Hub)

(30) පහත සංඛ්‍යා අතුරින් අෂ්ඨමය සංඛ්‍යාවක් වන්නේ

1. A675  2. 563  3. 987  4. EF12

(31) 101101දෙක යන ද්වීමය සංඛ්‍යාවට තුල්‍ය දශමය සංඛ්‍යාව කුමක්ද?

1. $40_{දහය}$  2. $45_{දහය}$  3. $36_{දහය}$  4. $52_{දහය}$

(32) 10111 + 11011 සුලු කළ විට ලැබෙන පිළිතුර කුමක්ද ?

1. $100010_{දෙක}$  2. $110010_{දෙක}$  3. $111011_{දෙක}$  4. $101111_{දෙක}$

(33) $120_{10}$ සංඛ්‍යාව තුල්‍ය වන්නේ කුමකටද?

1. $1111000_{දෙක}$  2. $160_{අට}$  3. $76_{දාසය}$  4. $101111_{දෙක}$

(34) පහත දැක්වෙන දැක්වෙන $101011_2$ සංඛ්‍යාව තුල්‍ය වන දශමය සංඛ්‍යාව කුමක්ද?

1. $42_{දහය}$ 2. $39_{දහය}$ 3. $44_{දහය}$ 4. $43_{දහය}$

(35) පහත දැක්වෙන සංඛ්‍යා අතරින් අවම අගය කුමක්ද?

1. $101101_{දෙක}$ 2. $36_{අට}$ 3. $2F_{දාසය}$ 4. $45_{දහය}$

(36) 001.10001යන සංඛ්‍යාවේ අඩුම වෙසෙසි බිටුව (LSB) හා වැඩිම වෙසෙසි බිටුව (MSB) පිළිවෙළින් දැක්වූ විට පිළිතුර වන්නේ,

1. 0, 0 2. 0, 1 3. 1, 0 4. 1, 1

(37) 7Aදාසය යන ශඩ් දශමය සංඛාව තුල්‍ය වන අෂ්ඨමය සංඛ්‍යාව වන්නේ,

1. $1111010_{දෙක}$ 2. $172_{අට}$ 3. $124_{දහය}$ 4. $74_{අට}$

(38) $100011_2$, 54 , $76_8$, 2F හතරේ ආරෝහණ පටිපාටිය නිරූපණය කරන්නේද?

1. $2F_{16}$, $7_8$, $100011_2$, 54
2. $100011_2$, $76_8$, $2F_{16}$, 54
3. 54 , $2F_{16}$, $100011_2$, $76_8$
4. $100011_2$, $2F_{16}$, 54 , $76_8$

s

(39) පහත දැක්වෙන BCD (Binary Coded Decimal) නිරූපණ වලින් විශාලම සංඛ්‍යාව කුමක්ද?

1. 01000101 2. 10010001 3. 00110100 4. 10011001

(40) 'c' අනුලක්ෂණය ASCII කේත ක්‍රමයේ දී 1100011 මගින් නිරූපණය වේ නම්, f අක්ෂරය නිරූපණය කෙරෙනුයේ පහත කුමකින්ද ?

1. 1110100 2. 1100110 3 1101011 4. 1101011

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 80 | S | II |
|---|---|---|

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 10 - 2020

නම/විභාග අංකය :..........................

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය - II

කාලය: පැය 02යි.

- පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

---

**(01)** (i) පහත A හා B තීරුවලින් දැක්වෙන්නේ පිළිවෙලින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ යෙදවුම් හා එහි භාවිතයන් සඳහා උදාහරණයන් ය A තීරුවේ දැක්වෙන යෙදවුම B තීරුවේ දැක්වෙන උදාහරණය සමග ගලපා ඊට ආදාල අක්ෂර යුගලය ලියා දක්වන්න.

| A | | B | |
|---|---|---|---|
| i | සෞඛ්‍ය ක්ෂේත්‍රය | a | ඉගෙනුම් කළමණාකරණය පද්ධති (LMS) |
| ii | කෘෂිකාර්මික ක්ෂේත්‍රය | b | EEG යන්ත්‍රය භාවිතා කිරීම |
| iii | අධ්‍යාපන ක්ෂේත්‍රය | c | RFID සංඥා භාවිතා කිරීම |
| iv | ගමනාගමන ක්ෂේත්‍රය | d | ETC (Electronic Toll Collection) යොදා ගැනීම |

(ii) ෂඩ් දශමය D6B ද්විමය සංඛ්‍යාවක් බවට පරිවර්තනය කරන්න. ගණනය කිරීමේ පියවර දක්වන්න.

(iii) විවිධ ආචයන උපාංගවලට එකිනෙකට වෙනස් ධාරිතාවන් ඇත. පහත දක්වා ඇති ආචයන උපාංග ධාරිතාව වැඩිවන පිළිවෙලට සකසන්න. (අදාළ අක්ෂරය පමණක් දැක්වීම ප්‍රමාණවත් වේ.)
- (a) සැනෙලි මතකය (Flash Memory)
- (b) නිහිත මතකය (Cache Memory)
- (c) චුම්භක පටිය (Magnetic Tape)
- (d) රෙජිස්තර මතකය (Register Memory)

(iv) (a) ජංගම දුරකතනයක අමතර දත්ත ගබඩාකිරීමට යොදාගන්නා ආචයන මාධ්‍යක් නම් කරන්න.
- (b) සේවායෝජක පරිගණකවල දත්ත හා තොරතුරු උපස්ථ කිරීමට බහුලව භාවිතයට ගන්නා උපක්‍රමය ලියන්න.

(v) පහත සඳහන් කර ඇති මුද්‍රණ යන්ත්‍ර සංඝට්ටන මුද්‍රණ යන්ත්‍ර හා සංඝට්ටන නොවන මුද්‍රණ යන්ත්‍ර ලෙස වර්ග කර ලියන්න.
- (a) පේළි මුද්‍රකය (Line Printer)
- (b) තීන්ත විදුම් මුද්‍රණ යන්ත්‍රය (Inkjet Printer)
- (c) තාප මුද්‍රකය (Thermal Printer)
- (d) තිත් න්‍යාස මුද්‍රකය (Dot Matrix Printer)

(vi) දත්ත සන්නිවේදනය සම්බන්ධයෙන් පහත දී ඇති වගන්ති සත්‍ය ද, අසත්‍ය ද යන්න ලේබල අංකය ඉදිරියෙන් ලියන්න.
- (a) ඉතා වේගවත් පරිගණක ජාල සම්බන්ධතාවයක් ඇති කිරීමට මං හසුරුව (Router) භාවිත කරයි.
- (b) රැහැන් රහිත යතුරු පුවරු සහ මූසික සම්බන්ධ කිරීම සඳහා අධෝරක්ත කිරණ දත්ත සම්ප්‍රේෂණ මාධ්‍යය යොදා ගනියි.
- (c) ස්විචය අර්ධ ද්විපථ දත්ත සම්ප්‍රේෂණ ක්‍රමයකට උදාහරණයකි.
- (d) එක් ගොඩනැගිල්ලක කාමරයක් තුළ හෝ කාමර කිහිපයක් සම්බන්ධ කරමින් ස්ථාපිත කර ඇති පරිගණක ජාලයක් පුරවර ප්‍රදේශ ජාලයික් (MAN) ලෙස හැඳින්වේ

(vii) සැනෙලි ආචයන උපක්‍රමයක ධාරිතාවය $2^{30}$ Byte කි. එහි ධාරිතාවය GB වලින් දක්වන්න.

(viii) "K" අක්ෂරය ASCII වගුවේ දශමය නිරූපණය වන්නේ 75 ලෙස නම්, "OR" වදනේ ද්විමය නිරූපණය එක් අක්ෂරයකට බිටු 7 බැගින් යොදා ලියන්න.

(ix) පරිගණකය පළමු පරම්පරාවේ සිට පස්වන පරම්පරාව දක්වා පරිණාමය වීමේ දී සිදුවූ වෙනස්කම් 2ක් ලියන්න.

(x) පහත දක්වා ඇති වගුවේ A සිට D දක්වා අක්ෂරවලින් විවිධ උපක්‍රම මගින් සිදු කරනු ලබන ක්‍රියාවලි දැක්වෙන අතර එම උපක්‍රමය පරිගණකයට සම්බන්ධ කරන කෙවෙනි (Ports) ඉදිරියෙන් දැක්වේ. එම ක්‍රියාවලි සහ කෙවෙනි නියමිත අනුපිළිවෙලට සටහන් කර ලියන්න.

| | ක්‍රියාවලිය | | කෙවෙනිය |
|---|---|---|---|
| A | බාහිර දෘඪ තැටියක් පරිගණකයට සම්බන්ධ කිරීම | P | HDMI |
| B | බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් සම්බන්ධ කිරීම | Q | RJ/45 |
| C | පැරණි මූසිකයක් පරිගණකයකට සම්බන්ධ කිරීම | R | USB |
| D | පරිගණකයක් ස්විචයකට සම්බන්ධ කිරීම | S | PS/2 |

(ලකුණු - 2 x 10 = 20)

(02) (අ) ගුණාත්මක තොරතුරක ලක්ෂණ වලට අදාල පහත සඳහන් ප්‍රකාශ සලකන්න. එම ප්‍රකාශන් මගින් පිළිබිඹු කරන ලක්ෂණය දී ඇති ලැයිස්තුවෙන් තෝරා ප්‍රශ්න අංකය සමග ගලපා ලියන්න.

1. ධීවරයෙක් සෑම විටම දිනයේ කාලගුණ වාර්තාව ඇසීම.
2. කිසියම් වෙළඳ ආයතනයක දුරකතන අංකයක් අවශ්‍ය වූ විට එම ආයතනයටම ගොස් ලබාගැනීම.
3. ඡායාරූප සැකසීමේ ආයතනයකට ග්‍රාපික සංස්කරණ ශිල්පියෙකු බඳවා ගැනීමට ග්‍රාපික සංස්කරණ පාඨමාලාවක් හදාරා තිබීම ප්‍රමාණවත් වේ.
4. සිසුන් පස් දෙනෙකු වාර විභාගය සඳහා පෙනී නොසිටි බැවින් 11 ශ්‍රේණිය පිළිබඳ සාර්ථක විශ්ලේෂණයක් කිරීම අසීරු බව පන්තිභාර ගුරුවරයා පවසයි.

(අංගසම්පූර්ණ බව, නිරවද්‍යතාව, අදාල බව, කාලීන බව, පිරිවැය අවම වීම) (ලකුණු 04)


(ආ) (i) ඉ-රාජ්‍ය මගින් වෙනත් රාජ්‍යවලට ලබාදෙන සේවාවන් 02 ක් ලියන්න. (ලකුණු 02)

(ii) වර්තමානයේදී ඉතාම කලබලකාරී අවිවේකී ජීවිත ගතකරන මිනිසාට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මගින් මදකට හෝ අස්වැසිල්ලක් ලබා ගත හැකි අවස්ථා නිර්මාණය කර ඇත. එවැනි අවස්ථා 2ක් නම් කරන්න. (ලකුණු 02)

(iii) නවරත්න මහතා කොළඹ කොටුව දුම්රිය ස්ථානයට ගොස් රඹුක්කන දක්වා ගමන් කිරීම සඳහා 2 වෙනි පන්තිය ප්‍රවේශ පත්‍රයක් ලබා ගැනීම සඳහා මුදල් ලබා දෙයි. ප්‍රවේශ පත්‍ර නිලධාරීයා මුදල් පරීක්ෂාකර ගමනාන්තය සහ දිනය සටහන් කර අදාළ ප්‍රවේශ පත්‍රය නිකුත් කරයි. මෙම අවස්ථාවෙහි නිරූපණය කරන ආදාන, සැකසීම, ප්‍රතිදානය වෙන් කර ලියන්න. (ලකුණු 02)

**(3)** මෙම රූපයේ සිටින ඇමරිකානු ජාතික ගණිතඥ (John Von Neumann) 1945 දී පරිගණකයේ නිර්මිතයහි ව්‍යුහාත්මක ආකාරය පිළිබඳව සංකල්පය ඉදිරිපත් කර ලදී. එම සංකල්පයට අනුව වර්තමානයේ අපි භාවිතා කරන පරිගණකය නිර්මාණය කර ඇත.


John von Neumann
1903 – 1957




එම ආකෘතිය යොදාගෙන පරිගණකයේ ක්‍රියාකාරිත්වය පහත විස්තර කර ඇත. එහි හිස්තැන් වල ඇති අංක වලට අදාල වචන වරහන් තුළ ඇති පද අතරින් තෝරා ලියන්න.

(A) (i) .............................. (1) මගින් ආදානය කරනු ලබන දත්ත සහ උපදෙස් මුලින්ම ගමන් කරන්නේ .............................. (2) වෙතයි.

(ii) එම දත්ත සකස් කිරීම සඳහා .............................. (3) වෙත යොමුවේ. එය .............................. (4) .............................. (5) හා මතක රෙජිස්තර නම් වූ කොටස් තුනකින් සමන්විත වේ.

(iii) .............................. (3) විසින් සකස් කරන ලද දත්ත සහ උපදෙස් තොරතුරු ලෙස නැවත යොමුවන්නේ .............................. (2) වෙතයි.


(iv) එහිදී .............................. (6) මගින් තොරතුරු ප්‍රතිදානය කරයි

(v) එසේම තොරතුරු තැන්පත් කිරීම් සඳහා .............................. (7) වෙත යොමුවීම ද සිදුවිය හැක

(vi) .............................. (5) මගින් පරිගණකයට සම්බන්ධ කර ඇති දෘඪාංග අතර සන්නිවේදනය, මෙහෙයවීම හා පාලනය කිරීම සිදු කරයි.

***(පාලන ඒකකය, ප්‍රතිදාන උපාංග, ප්‍රධාන මතකය, ආදාන උපාංග, මධ්‍ය සැකසුම් ඒකකය, ද්විතික මතකය, අංක ගණිතමය හා තාර්කික ඒකකය)***

(B) පහත දැක්වෙන්නේ පරිගණකයේ මධ්‍ය සැකසුම් ඒකකයට ආසන්නතාවය හා ධාරිතාව අනුව ප්‍රාථමික මතකයන් ස්ථාපිත කර දක්වා ඇති රූප සටහනකි.




(i) A සිට C දක්වා ඇති ප්‍රාථමික මතකයන් අදාළ අක්ෂරය සමග පිළිවෙලින් ලියා දක්වන්න. (ලකුණු 03)

(ii) ද්විතියික මතකය සකස් කර ඇති තාක්ෂණයන් 2 ක් සඳහන් කර ඊට අදාළ උදාහරණය බැගින් ලියන්න. (ලකුණු 02)

(iii) කිලෝ බයිට් $2^{10}$ ප්‍රමාණය බයිට් වලට පරිවර්තනය කර ලියන්න. (ලකුණු 15)

**(4)** මෙවර උසස් පෙළ විභාගය සමත් වූ සාරංග විශ්ව විද්‍යාල ප්‍රවේශ අයදුම්පත පිරවීම සඳහා ලබා දී ඇති උපදෙස් මාලාව අනුගමනය කරමින් මාර්ගගත ලෙස විද්‍යුත් පෝරමය පුරවන අවස්ථාවේදී පහත උපදෙස් නිරීක්ෂණය විය. ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

(i) මෙම සිද්ධිය ඉ-රාජ්‍යය සංකල්පය තුළ රජය කුමන පාර්ශ්වයක් සමඟ තොරතුරු සන්නිවේදනය සිදු කිරීම පිළිබඳව උදාහරණයක් ද? (ලකුණු 01)

(ii) අයදුම්පත් යොමු කළ යුතු බව අවසාන දිනයට අදාළව වයස ගණනය කිරීම් සඳහා ඔහු පරිගණකයේ ස්ථාපිත කැල්කියුලේටර් මෘදුකාංගය යොදා ගත්තේ නම් එම ගණනය කිරීම් සිදුවන්නේ පරිගණකයෙහි කුමන උපාංගයක් තුළද? (ලකුණු 02)

(iii) හැඳුනුම්පතෙහි මෘදු පිටපතක් (soft copy) පෝරමයට ඇතුළත් කළයුතු බැවින් ප්‍රථමයෙන් ඔහුගේ හැඳුනුම්පතෙහි ඡායා රූපයක් පරිගණකයට ඇතුළත් කළ යුතුව ඇත. ඒ සඳහා වඩාත් සුදුසු ආදාන උපක්‍රමය කුමක්ද? (ලකුණු 02)

(iv) ප්‍රථමයෙන් හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් තැන්පත් කළ ඔහු මාර්ගගත ලෙස විද්‍යුත් පෝරමය පුරමින් සිටින විට විදුලිය විසන්ධි විය නැවතත් විදුලිය පැමිණි පසු පරිගණකය ක්‍රියාත්මක කර බැලීමේදී හැඳුනුම්පතෙහි ඡායාරූපය තිබුන නමුත් විද්‍යුත් පෝරමය දක්නට නොලැබිණි. එයට හේතුව පරිගණක මතක වර්ගීකරණය අනුව කුමක් විය හැකිද? (ලකුණු 02)

(v) ලේසර් මුද්‍රණ යන්ත්‍රයක් ආධාරයෙන් ලබාගත් පිටපතක් කොමිෂන් සභාව වෙත තැපෑලෙන් එවන මෙන් අවසන් උපදෙස් හි සඳහන් විය. මෙම මුද්‍රණ යන්ත්‍රය තෝරා ගැනීමට හේතුව කුමක් විය හැකිද? මෙයට අමතරව එම කාණ්ඩයේ මුද්‍රණ යන්ත්‍ර වල දැකිය හැකි පොදු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 03)

**(5)** මල්පිටිය මහජන පුස්තකාලයේ කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණින් කාර්ය මණ්ඩල හා මහජන පරිහරණයට අලුතින් පරිගණක කීපයක් ගැනීමට එහි පුස්තකාලාධිපතිනිය අදහස් කරයි. ලබාගන්නා පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර සුදුසු ජාලගත ස්ථල විද්‍යා රටාවකට අනුව ජාලගත කිරීමටද එතුමියගේ බලාපොරොත්තුවයි.

(i) මල්පිටිය මහජන පුස්තකාලයේ පරිගණක ජාලගත කිරීම සඳහා ඔබ වෙත බාරදුන්නේ යැයි සිතා ස්විචයක්, පරිගණක 3 ක් හා මුද්‍රකයක් එකිනෙක සම්බන්ධ කර තරු ආකාරයේ ජාලයක් සකස් කිරීමට අදාළ දළ රූප සටහනක් ඇඳ දක්වන්න. (Switch, Computer1, Computer2, Computer3, Printer යන ලේබල යොදා ගන්න) (ලකුණු 3 යි)



(ii) ඉහත ජාලය සඳහා ස්විචය (Switch ) වෙනුවට නාභිය (Hub) යොදාගත්තේ නම් පරිගණක ජාලයට සිදුවන අවාසි සහගත තත්වයන් 2 ක් ලියන්න. (ලකුණු 2 යි)

(iii) ඉහත පුස්තකාලයේ තරු අකාරයේ පරිගණක ජාල ස්ථල විද්‍යාව වෙනුවට මුදු ආකාරයේ ස්ථල විද්‍යා රටාවක් (Ring Topology ) භාවිතා කළේ නම් ඇතිවන එක් අවාසියක් ලියා දක්වන්න. (ලකුණු 1 යි)

(iv) පරිගණක හා උපාංග හුදෙකලා කර භාවිතා කරනවාට වඩා ජාලගත කිරීම මගින් මල්පිටිය මහජන පුස්තකාලයට ලබාගත හැකි වාසි 2 ක් ලියන්න. (ලකුණු 2 යි)

(v) වර්තමානයේ ඉතා ජනප්‍රිය දත්ත සම්ප්‍රේෂණ මාධ්‍යයක් ලෙස ගුවන් විදුලි සම්ප්‍රේෂණය භාවිතා කරයි. එදිනෙදා ජීවිතයේදී ගුවන් විදුලි සම්ප්‍රේෂණය යොදාගැනෙන අවස්ථා 2 ක් ලියන්න. (ලකුණු 2 යි)

**(6)** පළවෙනි වාරය අවසානයේ පැතුම් හට ඔහුගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂය උගන්වන ගුරුතුමා විසින් පරිගණකයේ පරිණාමය යන මාතෘකාව යටතේ මාර්ගගත පැවරුමක් ලබා දෙන ලදි. ඉන් උපුටාගත් කොටසක් පහත දක්වේ

| A | B | C | D |
|---|---|---|---|
|  |  |  |  |
| ගණනය කිරීමේ කටයුතු සඳහා පැරණි කාලයේ භාවිතා කළ උපකරණයකි | පරිගණකය පිළිබඳ මූලික සංකල්පය ඇතුළත් කොට චාර්ල්ස් බැබේජ් විසින් නිපදවූවකි | පරිගණකයේ කාර්යක්ෂමතාවය වැඩිවීම මෙම උපාංගය සොයාගැනීමත් සමග සිදුවිය. | තුන් වෙනි පරම්පරාවේ දත්ත ගබඩා කිරීමට භාවිතා කළ උපාංගයකි. |

*(ට්‍රාන්සිස්ටර්, ඇනලිටිකල් එන්ජින්, ඇබකසය, චුම්භක පටි)*

(i) ඉහත රූප සටහන් වල පහලින් ඇති හෝඩුවාව කියවා එම රූපයට අදාල උපාංගයේ නාම දී ඇති ලැයිස්තුවෙන් තෝරා අක්ෂරය සමග ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න. (ලකුණු 2 යි)

(ii) C අක්ෂරයෙන් හඳුන්වා ඇති උපාංගය සොයාගැනීමත් සමග එම උපාංගය යොදා නිර්මාණය කළ පරිගණක කාර්යක්ෂමතාවයෙන් වැඩි බව සඳහන් කර ඇත. මෙම පරිගණක අයත්වන්නේ කුමන පරම්පරාවේ පරිගණක වලටද? එම පරම්පරාවේ පරිගණක වල දැකිය හැකි තවත් ලක්ෂණ දෙකක් ලියන්න.

(ලකුණු 3 යි)

(iii) පරිගණක පරිණාමය සම්බන්ධයෙන් පහත දක්වා ඇති ප්‍රකාශයන් සත්‍ය නම් "සත්‍යයි" ලෙස ද අසත්‍ය නම් "අසත්‍යයි" ලෙස ද, දී ඇති අක්ෂරය සමග ලියන්න.

A. දත්ත ආදානයට හා ප්‍රතිදානය සඳහා සිදුරු පත්‍රිකා භාවිතා කරනු ලැබුයේ පළමුවෙනි පරම්පරාවේ පරිගණක වල ය. ( )

B. පළමු වරට අන්තර්ජාලය භාවිතා කිරීමට ආරම්භවූයේ දෙවෙනි පරම්පරාවේ පරිගණක භාවිතයට පැමිණීමත් සමගය. ( )

C. අධික පරිමාණයේ අනුකලිත පරිපථ වල දත්ත සකස්කිරීමේ වේගයට වඩා අති විශාල පරිමාණයේ අනුකලිත පරිපථවල දත්ත සකස්කිරීමේ වේගය අඩුයි. ( )

D. චාර්ල්ස් බැබේජ් පරිගණකයේ පියා වීම සඳහා ප්‍රධාන හේතුව වූයේ සිදුරු පත්‍රිකා ක්‍රමය හඳුන්වා දීමයි. ( )

E. ලොව ප්‍රථම අංකිත ගණක යන්ත්‍රය වන Mark 1 නිපදවූයේ හොවාර්ඩ් එයිට්කන් විසිනි. ( )

(ලකුණු 5 යි)

**(7)** (i) පහත සඳහන් එක් එක් සංඛ්‍යා අයත් විය හැකි ද්විමය, අෂ්ටමය, දශමය සංඛ්‍යා පද්ධති අතරින් කුමන සංඛ්‍යා පද්ධතින්ට දැයි හිස්තැනෙහි ලියන්න.

| | සංඛ්‍යාව | සංඛ්‍යා පද්ධතින් |
|---|---|---|
| A. | 23 | ………………………… |
| B. | 845 | ……………………….. |

(ලකුණු 0. 5 x 2= 1)

(ii) පහත දැක්වෙන සංඛ්‍යාවන්හි වැඩිම වෙසෙසි සංඛ්‍යාංකය(MSD) හා අඩුම වෙසෙසි සංඛ්‍යාංකය(LSD) ලියන්න.

A. 7820 B. 50.320 (ලකුණු 0. 5 x 2= 1)

(iii) උදෑසන පාසලට පැමිණීමට සුදානම් වූ නිමන්තට මව විසින් රු 100 ක මුදලක් ලබා දෙන ලදි. මෙම මුදල රැගෙන පාසල් ආපනශාලාවට ගිය ඔහු රු $36_8$ ක ඉදිආප්ප පාර්සලයක්ද රු $110010_2$ ක් දී යෝගට් බීම බෝතලයක්ද මිලට ගන්නා ලදී.

අ. නිමන්තට මව ලබාදුන් මුදල ද්විමය සංඛ්‍යාවක් ලෙස දක්වන්න (ලකුණු 1)

ආ. ඉදිආප්ප පාර්සලයක් මිලට ගැනීම සඳහා ගෙවිය යුතු මුදල ශඩ්දශමය සංඛ්‍යාවක් ලෙස දක්වන්න (ලකුණු 2)

ඇ. ඉදිආප්ප හා යෝගට් බීම බෝතලය ලබා ගත් පසු ආපනශාලා හිමියා විසින් නිමන්තට ලබාදෙන ඉතිරි මුදල දශමය සංඛ්‍යාවක් ලෙස ලියන්න. (ලකුණු 2)

(iv) පරිගණකයෙහි දත්ත නිරූපණය සඳහා භාවිතා කරන කේත ක්‍රම පිළිබඳව තොරතුරු ඇතුලත් පහත වගුව සම්පූර්ණ කරන්න.

| | සංකේතයක් නිරූපනය කිරීමට යොදා ගන්නා bit ගණන | නිරූපනය කළ හැකි අනුලක්ෂණ සංඛ්‍යාව |
|---|---|---|
| BCD | ……………………. | ……………………. |
| ASCII | ……………………. | ……………………. |
| EBCDIC | ……………………. | ……………………. |
| Unicode | ……………………. | ……………………. |

(v) 53 යන සංඛ්‍යාව BCD (Binary coded Decimal) මගින් නිරූපනය වන්නේ කෙසේදැයි පියවර සහිතව ලියන්න.